311714

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
පොත් සහ ප්‍රවෘත්ති පත්‍ර
රෙජිස්ට්‍රාර් කාර්යාලය
13 JAN 2003
ශ්‍රී ලංකා SRI LANKA ශ්‍රී ලංකා

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1255/3 - 2002 සැප්තැම්බර් 23 වැනි සඳුදා - 2002.09.23

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

එල්.ඩී.බී. - 6/2001.

### 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 78 වන වගන්තිය සමඟ කියවිය යුතු 105 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සාදන ලද රීති.

ආචාර්ය දයානාත් සී. ජයසූරිය,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය.

2002 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

### රීති

1. මේ රීති 2002 රක්ෂණ නියෝජිතයන්ගේ සුදුසුකම් රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. යම් තැනැත්තකු -

(අ) වයස අවුරුදු දහ අටට වැඩි නම් මිස:

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නම් මිස:

(ඇ) පහත සඳහන් අවම සුදුසුකම් ලබා ඇත්නම් මිස: එනම්,

(i) අවම වශයෙන් ගණිතය හෝ අංක ගණිතයට සම්මාන සාමාර්ථයක් සහිතව අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හයකින් සමත්වීම: හෝ

(ii) මේ රීති බලාත්මක වන දිනයේදී රක්ෂණ නියෝජිතයකු ලෙස අවුරුදු පහකට නොඅඩු පළපුරුද්ද ඇත්නම් මිස:

(ඇ) ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (ශ්‍රී.ලං.ර.ආ.) මගින් හෝ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් අනුමත කර ඇති වෙනත් යම් මණ්ඩලයක් විසින් පවත්වනු ලබන පෙර-බඳවා ගැනීම් පරීක්ෂණය සමත්ව ඇත්නම් මිස:

(ඉ) කිසිම අපරාධයකට වරදකරු වී නැත්නම් මිස:

(ඊ) රක්ෂණ සමාගමක් හෝ තැරැව්කරුවකු විසින් හඳුන්වා දෙනු ලැබ ඇත්තේ නම් මිස: සහ

(උ) ලියාපදිංචි රක්ෂණ කරුවකුගේ හෝ තැරැව්කරුවකුගේ වැටුප් ලබන සේවා නියුක්තයකු නොවන්නේ නම් මිස

ඒ තැනැත්තා රක්ෂණ නියෝජිතයකු ලෙස ලියාපදිංචි නොකළ යුතුය.

3. සෑම රක්ෂණකරුවකු හා තැරැව්කරුවකු වෙතම රක්ෂණ නියෝජිතයන් වශයෙන් තමන් සමග ලියාපදිංචි වී ඇති පුද්ගලයන් පිළිබඳ ලේඛනයක් මෙහි උපලේඛනයෙහි නියම්කොට දක්වා ඇති ආකෘතිපත්‍රය අනුව එම රක්ෂණකරු හෝ තැරැව්කරු විසින් පවත්වාගෙන යා යුතු ය.

1A-G 001939 - 550 (2002/09)

## රක්ෂණ නියෝජිතයන් පිළිබඳ රෙජිස්ටරය

*2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 78(1) වන වගන්තිය ප්‍රකාරව පවත්වාගෙන යා යුතු ය.*

1. රක්ෂණ සමාගම/රක්ෂණ තැරැව්කරු:—

2. රක්ෂණ නියෝජිතයාගේ සම්පූර්ණ නම:—

3. උපන් දිනය:— දිනය ☐☐ මාසය ☐☐ වර්ෂය ☐☐☐☐

4. ස්ත්‍රී පුරුෂ භාවය:— පුරුෂ ☐ ස්ත්‍රී ☐

5. ජා. හැ. අංකය:— ☐☐☐☐☐☐☐☐☐☐

6. ජාතිය:—

7. ලිපිනය (නිවසේ):—

8. අධ්‍යාපන සුදුසුකම්:—

9. පත්වීමේ දිනය:— දිනය ☐☐ මාසය ☐☐ වර්ෂය ☐☐☐☐

10. සාමාන්‍ය රක්ෂණය සඳහා නියෝජිත ☐

    දීර්ඝකාලීන රක්ෂණය සඳහා නියෝජිත ☐

    දීර්ඝකාලීන සහ සාමාන්‍ය රක්ෂණය සඳහා නියෝජිත ☐

ගිවිසුම අවසන් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වෙත වහාම දැනුම් දිය යුතුය.

10-108

86670
02 MAY 2003
NATIONAL LIBRARY AND
DOCUMENTATION CENTRE

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.